# ශ්‍රී ලංකාවේ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවේ සිංහල මාධ්‍ය පාඨමාලාවල ඉගැන්වීමේ සාමාන්‍ය ක්‍රම විෂයයෙන් අපේක්ෂිත නිපුණතා සාධනයේ ස්වභාවය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එම්. එම්. ලීලාවතී

අධ්‍යාපන වේදී දෙවන පෙළ (පහළ) උපාධිය,

අධ්‍යාපනපති උපාධිය.

ශ්‍රී ලංකා කොළඹ විශ්ව විද්‍යාලය

කොළඹ

UCLIB

543677

ශ්‍රී ලංකා කොළඹ විශ්ව විද්‍යාලයයේ අධ්‍යාපන පීඨයේ අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන නිබන්ධනය 99/M.Phil/05

## Abstract

Education is generally considered to be the only means that moulds man to adapt to the new world that constantly experiences changes with bizarre events that amaze the people all over it.

In education, teaching-learning process occurs through the interaction of the three main variables namely, lesson content, the teacher and the student. Educational history of the country assures the fact that this process has changed according to the new findings, educational philosophy and the contribution made by the respective governments.

In this context, the teacher needs a comprehensive training for him to effectively implement his specific task. In this respect, teacher training occupies a significant place. In Sri Lanka, teacher education has been provided by different educational institutes using various types of methodology. In this direction, the pre-service teacher training courses conducted by the National Colleges of Education hold a unique place.

The pre-service teacher-training courses underwent certain modifications in 1998 in accordance with the new educational reforms introduced by taking into account the global trends in the field of education. The number of National Diploma in Teaching Courses conducted by the National Colleges of Education has increased from 6 in 5 Colleges in 1985 to 22 in 17 Colleges at present. A panel of scholarly personnel identified 68 competencies based on 10 principles, which the initial teacher trainees are expected to acquire and issued a vision statement, and the curricula were accordingly modified. Further, a number of changes were introduced to the teaching-learning process with a preparation of teaching learning instruments paying

attention to the competency based teacher training approach in the traditional teacher training framework.

It is time to examine how the Colleges of Education get adjusted to the new changes, what their strengths and weaknesses are and whether the teacher trainees join the school system equipped with effective competencies. Therefore, this study is concerned with 10 competencies expected to be obtained from General Methods of Teaching, a new subject of the National Diploma in Teaching Course.

There are five objectives in this study. They include the examination of the structural nature of the new subject, its teaching-learning process, the nature of the expected competency performance level of the subject, the advantages and disadvantages faced by the lecturers and teacher trainees and providing suggestions based on the information gained for the future development of the subject.

In carrying out this study according to the above objective, the following data collection methods were employed. Interviews were conducted with five scholarly personnel who contributed to introduce changes mentioned elsewhere, reference done to obtain secondary data, observation of the teaching-learning process of ten courses at four Colleges of Education, two questionnaires were administered for 20 lectures and 575 teacher trainees respectively, observation of lessons of randomly selected 78 teacher trainees was done. Discussions were conducted with the teacher trainees and their notes were evaluated.

The research-reporting model was used to record the data of the study. The data collected was arranged according to the objectives, and tabulated with percentages and chi-square distribution. The conclusions made from the analysis of the data reveal that the introduction of the General Methods of Teaching, Educational Practice and Competencies to the National Diploma in Teaching Course has not been done with a proper understanding and a good coordination of their structural nature, and

those who are involved in the teaching-learning process in the National Colleges of Education have only a slight understanding and less expertise of the competency based training. They also reveal a lack of teaching-learning material, physical resources, and quality inputs for implementing the competency-based approach. The other findings are the use of teacher-centered methodology in teaching-learning process, and a competency performance level stands less than 95%. It is also revealed that the Course has influenced the development of some competencies and the Educational Practice has contributed greatly for giving and acquiring competencies.

Since different problems have been encounterd in following the Competency-Based Approach in the traditional framework, it is important to reconsider and decide permanently on whether the competency-based approach can be used to create a teacher generation equipped with effective competencies to overcome such problems. And the study has been concluded suggesting how such a programme is to be successfully planned, implemented and evaluated in relation to development, if the competency-based approach is to be used.

## සංක්ෂිප්තය

මුළු මහත් විශ්වයම විශ්මයට පත් කරවමින් විස්මිත දෑ දිනපතා සිදු වෙමින් වෙනස්වෙමින් පවතින නව ලොවට අනුවර්තනය වීමට මිනිසා හැඩගස්වන ඒකායන මාර්ගය අධ්‍යාපනයයි.

අධ්‍යාපනය ලබා දීමේදී ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය, විෂයමාලාව, ගුරුවරයා හා ශිෂ්‍යයා යන ප්‍රධාන විචල්‍යය තුනෙහි අන්තර් ක්‍රියාවෙන් සිදුවන්නකි. මෙම ක්‍රියාවලිය ද නවතම සොයා ගැනීම්, ඒ ඒ රජයන්හි දර්ශන හා මෙහෙවර අනුව වෙනස් වූ බව ඉතිහාසය ඒත්තු ගන්වයි.

මෙහි දී ගුරුවරයාට හිමිවන සුවිශේෂී කාර්ය භාරය, සාර්ථකව ඉටු කිරීමට නම් ඔහුට ද පුහුණුවක් අවශ්‍යම ය. එහි දී ගුරු අධ්‍යාපනයට හිමිවන්නේ විශේෂ ස්ථානයකි. ලංකාවේ විවිධ අධ්‍යාපනික ආයතන මගින් විවිධ ක්‍රමවේද අනුව ගුරු අධ්‍යාපනය ක්‍රියාත්මක වී ඇත. එහි දී ජාතික අධ්‍යාපන විද්‍යා පීඨවල ක්‍රියාත්මක වන පූර්ව සේවා ගුරු පුහුණු පාඨමාලාවලට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි.

වර්ෂ 1998 දී විශ්ව ව්‍යාප්ත ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් ලංකාවේ ඇති කරන ලද නව පාසල් අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුරූපව පූර්ව සේවා ගුරු පුහුණු පාඨමාලාවල ද නවීකරණ සිදු විණි. වර්ෂ 1985 දී අධ්‍යාපන විද්‍යා පීඨ පහක පාඨමාලා හයකින් ඇරඹුණ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලා වර්තමානයේ ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ 17 ක පාඨමාලා 22 ක් ව්‍යාප්ත විණි. විද්වත් මණ්ඩලයක් විසින් දර්ශන ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් මූලධර්ම දහයක් යටතේ හඳුනාගත් නිපුණතා 68 ක් මෙම පාඨමාලා හැදෑරූ ගුරුවරුන් තුළ තිබිය යුතු යැයි සලකා ගැලපෙන සේ විෂයය නිර්දේශ නවීකරණය විය. එසේම සාම්ප්‍රදායික ගුරු පුහුණු රාමුව තුළම නිපුණතා පාදක ගුරු පුහුණු ප්‍රවේශය අවධාරණය කරමින් ඉගෙනුම්-ඉගැන්වීම් ද්‍රව්‍ය සකස් කර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ ද වෙනස්කම් රැසක් ඇති කෙරිණි.

නව වෙනස්වීම්වලට අධ්‍යාපන විද්‍යා පීඨ අනුගත වන්නේ කෙසේ ද? දුබලතා ප්‍රබලතා කවරේ ද? ඵලදායී නිපුණතා සාධනයක් ඇතිව පුහුණුවන අභ්‍යාසලාභීන් පාසල් පද්ධතියට එකතු වන්නේ ද? ආදිය විමසා බැලීම කාලෝචිත ය. එබැවින් මෙම අධ්‍යයනය ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවේ නව විෂයයක් වූ ඉගැන්වීමේ සාමාන්‍ය ක්‍රම විෂයයෙන් අපේක්ෂිත නිපුණතා දහයක් කේන්ද්‍ර කරගෙන ක්‍රියාත්මක වේ.

අධ්‍යයනයේ අරමුණු පහකි. ඒවා නම් ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවට එක් වූ නව විෂයයේ ව්‍යුහාත්මක ස්වභාවය විමර්ශනය කිරීම, එහි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය විමර්ශනය කිරීම, විෂයයෙන් අපේක්ෂිත නිපුණතා සාධනයේ ස්වභාවය විමසා බැලීම, එහි දී කථිකාචාර්යවරුන් හා ගුරු සිසුන් මුහුණ දෙන වාසි හා අවාසි සාධක සොයා බැලීම හා ලැබෙන තොරතුරු පදනම් කරගෙන අනාගත සංවර්ධනයට යෝජනා ඉදිරිපත් කිරීම වේ.

මෙම අරමුණු අනුව අධ්‍යයනය මෙහෙයවීමේ දී නව වෙනස්කම් ඇති කිරීමෙහි ලා දායක වූ විද්වත් මණ්ඩලයේ හය දෙනෙකු සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම, පොත් පත් පරිශීලනය, විද්‍යා පීඨ හතරක පාඨමාලා දහයක ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය නිරීක්ෂණය, කථිකාචාර්ය විසි දෙනෙකු හා ගුරු අභ්‍යාසලාභීන් 575 කට ප්‍රශ්නාවලි යොමු කිරීම, අහඹු ලෙස තෝරාගත් ගුරු අභ්‍යාසලාභීන් 78 දෙනෙකුගේ පාඩම් නිරීක්ෂණ, ගුරු සිසු සාකච්ඡා හා ඔවුන්ගේ සටහන් අධ්‍යයනය යන ක්‍රම ශිල්ප තුළින් තොරතුරු රැස් කෙරිණි.

ලැබුණු තොරතුරු අරමුණුවලට අදාළව පෙළ ගස්වා වගු සටහන් මගින් දක්වා ප්‍රතිශත, කයි වර්ග ගණනය කිරීම් තුළින් ඉදිරිපත් කර ඇත. තොරතුරු විශ්ලේෂණයට අනුව ලැබුණු සමස්ත නිගමන වන්නේ, ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවට එක් වූ ඉගැන්වීමේ සාමාන්‍ය ක්‍රම, අධ්‍යාපන ව්‍යවහාර හා නිපුණතා පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඇතිව මනා සම්බන්ධීකරණයකින් ව්‍යුහාත්මක ස්වභාවය සිදු වී නො මැති වීම, අධ්‍යාපන විද්‍යා පීඨ තුළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි යෙදෙන්නන් තුළ නිපුණතා පාදක පුහුණුව පිළිබඳ සරල අවබෝධයක් හා අඩු ප්‍රවීනතාවයක් ඇති බව, නිපුණතා පාදක ප්‍රවේශය ක්‍රියාත්මක කිරීමට ඉගෙනුම්-ඉගැන්වීම් ද්‍රව්‍ය, භෞතික

පහසුකම් ගුණාත්මක යෙදවුම් ප්‍රමාණවත් පරිදි නො මැති බව, සම්ප්‍රදායික ගුරු කේන්ද්‍රීය ක්‍රමයම බහුලව දක්නට ලැබෙන බව, 95% මට්ටමෙත් නිපුණතා සාධනයක් සිදු වී නැති බව, ඇතැම් නිපුණතා සඳහා පාඨමාලා බලපෑමක් සිදු වී ඇති බව හා නිපුණතා ලබා දීමේ දී හා ලබා ගැනීමේ දී අධ්‍යාපන ව්‍යවහාර මහත් පිටුවහලක් වී ඇති බව යනාදිය යි.

සාම්ප්‍රදායික රාමුව තුළ නිපුණතා පාදක ප්‍රවේශය අනුගමනය කිරීමට යාමේදී විවිධ ගැටලුවලට මුහුණ දීමට සිදු වී ඇති හෙයින්, ඒවා නැති කර ඵලදායී නිපුණතාවලින් යුක්ත ගුරු පිරිසක් බිහි කර ගැනීමට නිපුණතා පාදක ප්‍රවේශය යොදා ගත්තේ ද? යන්න ගැන නැවත සලකා බලා තිරසාර තීරණයකට එළඹ, නිපුණතා පාදක ප්‍රවේශය යොදා ගත්තේ නම්, එවැනි වැඩපිළිවෙළක් සංවර්ධනයට අදාළව සාර්ථක ලෙස සැලසුම් කිරීම, ක්‍රියාවට පරිවර්තනය කිරීම, ඇගයීම් කිරීම කළයුතු ආකාරය යෝජනා කරමින් අධ්‍යයනය නිමා කර ඇත.